# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/68/20 ඔබේ අංකය :

2020.05.18

ලේකම්තුමා,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල,
BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**උප පොලිස් පරීක්ෂක නිලධාරීන්ගේ උසස්වීම් සම්බන්ධව.**

දීර්ඝ කාලයක් උසස්වීම් නොලබා සිටි පොලිස් නිලධාරීන් හට උසස්වීම් ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ හෘදයාංගම ස්තුතිය පිරිනමන්නට කැමැත්තෙමු.

එමෙන්ම 2020.02.08 වන දිනට පොලිස් පරීක්ෂක තනතුරේ සේවා කාලය වසර 10 ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් වෙත ද ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා දීම සඳහා කටයුතු කිරීම සම්බන්ධව තවදුරටත් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අපගේ කෘතඥතාවය පළකර සිටිමු.

ඒ අයුරින්ම උප පොලිස් පරීක්ෂක තනතුරේ සේවා කාලය මේ වන විට වසර 08 ක් සම්පූර්ණ කර ඇති, 2011 වසරේ ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් ලෙස ඉදුරාම පොලිස් නිත්‍ය සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් වෙත ද පොලිස් පරීක්ෂක තනතුර සඳහා උසස්වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් ඔබතුමාගෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටින්නෙමු.

මේ සම්බන්ධව 2011 වසරේ සේවයට බැඳි උප පොලිස් පරීක්ෂක නිලධාරීන් වෙනුවෙන් ඉදිරිපත් කර ඇති අභියාචනයේ පිටපතක් ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග යාකර ඇත.

ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

2020/05/18

ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිඥ, නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

අභිමානවත් පොලිසියක් ගොඩනගමු.